# "විශිෂ්ටයෙකු ලෙස විශිෂ්ටයන් අතරට ඔබත් එක්වන්න"

# ශ්‍රී ලංකා ගුවන් හමුදාව
සුරකිමු ලකඹර

# කැඩෙට් නිලධාරී/ නිලධාරිනී පුරප්පාඩු

| ශාඛාව | |
|---|---|
| ගුවන් නියමු පොදු රාජකාරී ශාඛාව | පිරිමි |
| ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු ශාඛාව | පිරිමි / කාන්තා |
| විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු ශාඛාව | පිරිමි |
| තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව | පිරිමි |
| මෙහෙයුම් ගුවන් ශාඛාව (ගුවන් ගමන් පාලක) | පිරිමි |
| රෙජිමේන්තු ශාඛාව | පිරිමි / කාන්තා |
| සැපයුම් ශාඛාව | පිරිමි / කාන්තා |
| පරිපාලන ශාඛාව | පිරිමි / කාන්තා |
| විනයාරක්ෂක ශාඛාව | පිරිමි |

## මූලික සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
- අවිවාහක විය යුතුය
- වයස : 2024 ජනවාරි මස 01 වන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි
- උස : පිරිමි - සෙන්ටිමීටර් 165 ට නොඅඩු (අඩි 5 යි අඟල් 5 ට නොඅඩු)
  කාන්තා - සෙන්ටිමීටර් 160 ට නොඅඩු (අඩි 5 යි අඟල් 3 ට නොඅඩු)
- බර : පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26
  කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25
- පපුව : පිරිමි - අඟල් 32 ට නොඅඩු විය යුතුය
- වර්ණ දෘෂ්ඨිකත්වය : CP2
- පෙනීම: වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිතව)

## මූලික අධ්‍යාපන සහ විශේෂිත සුදුසුකම්

- අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉන් ඉහල සාමාර්ථයක් ලබා සිටිය යුතුය.
- නියමු පොදු රාජකාරී / මෙහෙයුම් ගුවන් (ගුවන් ගමන් පාලක) ශාඛාවන් සඳහා අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව / ජීව විද්‍යා විෂය ධාරාව (භෞතික විද්‍යාව අනිවාර්ය විෂයක් ලෙස ඇතුලත්ව තිබිය යුතුය) හෝ තාක්ෂණය විෂය ධාරාවෙන් (තාක්ෂණවේදය සඳහා විද්‍යාව අනිවාර්ය විෂයක් ලෙස ඇතුලත්ව තිබිය යුතුය) එක් වරකදී ප්‍රධාන විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුය.
- ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු/විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු ශාඛාවන් සඳහා අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව අනිවාර්ය විෂයයන් ලෙස ඇතුලත්ව තිබිය යුතුය) හෝ තාක්ෂණය විෂය ධාරාවෙන් (තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්ෂණවේදය අනිවාර්ය විෂයයන් ලෙස ඇතුලත්ව තිබිය යුතුය ) එක් වරකදී විෂයන් තුනම සමත්ව අවම වශයෙන් ඉන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ ලබා සිටිය යුතුය.
- තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව සඳහා අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂය අනිවාර්ය විෂයක් ලෙස ඇතුලත්ව ඕනෑම විෂය ධාරාවකින් හෝ භෞතික විද්‍යාව විෂය ධාරාවෙන් එක් වරකදී අවම වශයෙන් විෂයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුය.
- අනෙකුත් ශාඛාවන් සඳහා අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය/ තාක්ෂණවේදය / කලා යන විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුය.
- Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවලට පෙනී සිටි සිසුන් අයදුම් කිරීමේදී එම විභාගයේ ප්‍රතිඵල සටහනේ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයන් ඇතුළුව විෂයන් හයක් සඳහා එක් වරකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහල අගයක් සඳහා ලබාදෙන සාමාර්ථයන් ලබා තිබීම සහ Pearson Edexcel / Cambridge - International Advanced Level විභාගයන්ට පෙනී සිටි සිසුන් ඉහත ශාඛාවන් සඳහා අයදුම් කිරීමේදී, අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී එම ශාඛාවන් සඳහා වෙන් වෙන්ව දක්වා ඇති විෂය පථයන් සහ එක් එක් විෂයන් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඉන් ඉහල අගයන් සඳහා ලබා දෙන සාමාර්ථයන් ලබා තිබිය යුතුය.

**තෝරාගනු ලබන සියළුම අයදුම්කරුවන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් පිලිගත් BSc (Aviation Studies) උපාධි වැඩ සටහන සඳහා සුදුසුකම් ලබයි**

## වැටුප්

- සේවා සහ අනෙකුත් සියළුම දීමනා සමග දළ වාර්ෂික වැටුප:

| | | | |
|---|---|---|---|
| පයිලට් ඔෆිසර් | Rs. 1,277,316.00 | ෆ්ලයින් ඔෆිසර් | Rs. 1,385,436.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | Rs. 1,481,556.00 | ස්කොඩ්‍රන් ලීඩර් | Rs. 1,545,636.00 |

## ප්‍රතිලාභ

- උසස් අධ්‍යාපන වරම්
- දේශීය සහ විදේශීය පුහුණු පාඨමාලා
- ආහාර සහ නවාතැන්
- නිල ඇඳුම්
- වෛද්‍ය සහ සුහසාධක පහසුකම්
- ජීවිත රක්ෂණාවරණ
- ගුවන් සහ ගොඩබිම් ප්‍රවාහන පහසුකම්
- නිවාඩු නිකේතන
- විවාහක නිවසින



**2023 සැප්තැම්බර් මස 30 වන දිනට පෙර අයදුම් කරන්න**

AIR FORCE RECRUITING
JOIN WITH US
follow us on facebook
Sri Lanka Air Force Recruiting

අන්තර්ජාලයෙන් අයඳුම් කිරීම සඳහා
www.airforce.lk/joinus/apply වෙත පිවිසෙන්න

+94 11 2 495 900

ආධුනිකයින් බඳවා ගැනීමේ ප්‍රධාන නිලධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ.

වැඩි විස්තර සඳහා අගෝස්තු මස 25 වන දින අංක 2347 දරණ රජයේ ගැසට් පත්‍රය හෝ www.documents.gov.lk බලන්න.